# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2277/51 - 2022 අප්‍රේල් මස 27 වැනි බදාදා - 2022.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 83

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වැනි වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සෑම සාදන්නන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, බෙදහරින්නන්, ගබඩාකරුවන් හෝ වෙළෙන්දන් විසින් මිලදී ගෙන බහාලුමක, ගුදමක, සයිලෝවක, ව්‍යාපාරික ස්ථානයක හෝ කුමන හෝ ස්ථානයක තබාගෙන සිටින භාණ්ඩවලට අදාළව තමාට භාණ්ඩ සැපයූ සාදන්නෙකු, නිෂ්පාදකයෙකු, සැපයුම්කරුවෙකු, බෙදහරින්නෙකු, ගබඩාකරුවෙකු, හෝ වෙළෙන්දෙකු විසින් ලිඛිත හෝ විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් හෝ බිල්පතක් හෝ ඉන්වොයිසියක් තම සන්තකයෙහි, පාලනයෙහි හෝ භාරයෙහි තබා ගත යුතු අතර, එම කුවිතාන්සියේ හෝ බිල්පතේ හෝ ඉන්වොයිසියේ පහත තොරතුරු ඇතුළත් වන්නේ නම් මිස එම භාණ්ඩ විකිණීම, ගබඩා කිරීම, රැස්කර තබා ගැනීම, බෙද හැරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා හෝ ප්‍රදර්ශනය කිරීම සිදු නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් විධාන කරනු ලැබේ.

1. භාණ්ඩ සැපයුම්කරුගේ නම සහ ලිපිනය
2. මිලට ගත් දිනය
3. ගැනුම් මිල
4. භාණ්ඩ වර්ගයේ නම
5. ප්‍රමාණය
6. කාණ්ඩ අංකය (ඇත්නම්)

මෙම විධානය 2022 අප්‍රේල් මස 27 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),
සභාපති.

2022 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය

EOG 04 - 0212


1A - G 36702 — 110 (2022/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*